# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත

---

[සහතිකය සටහන් කළේ **2005** ඔක්තෝබර් මස **18** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ඔක්තෝබර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 9.50 යි.** තැපැල් ගාස්තුව **: රු. 5.00 යි.**

# 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත

[සහතිකය සටහන් කළේ 2005 ඔක්තෝබර් මස 18 වැනි දින]

එල්. ඩී.— ඕ. 17/2005.

සේවායෝජකයන් විසින් සේවකයන්ට අයවැය සහන දීමනාවක් ගෙවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. (1) මේ පනත 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

(2) මේ පනතේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2005 අගෝස්තු මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

2. (1) මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස්වරයා නිසි බලධරයා විය යුතු ය. නිසි බලධරයා.

(2) මේ පනත මගින් නිසි බලධරයා වෙත පවරා ඇති යම් බලතල හෝ පනවා ඇති හෝ වෙන්කර දී ඇති යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එම බලධරයා විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

3. (1) 2005 අගෝස්තු මස 1 වන දින සිට බලපවත්වන පරිදි යම් කර්මාන්තයක නියුක්තව සිටින සෑම සේවායෝජකයකු විසින් ම සේවයේ නියුක්ත කරනු ලැබ සිටින සෑම සේවකයකුට ම එක් එක් මාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන පදනම මත ගණන් බලනු ලැබ (මෙහි මින් මතු "දීමනාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අයවැය සහන දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය :— අයවැය දීමනා ගෙවීම.

(අ) මාසික පාරිශ්‍රමිකය රුපියල් විසිදහසක් හෝ ඊට අඩු වූ සේවකයකු සම්බන්ධයෙන් වන විට ගෙවිය යුතු දීමනාව රුපියල් එක් දහසක් විය යුතු ය :

එසේ වුව ද, යම් සේවකයකුට සේවය ලබාදීමට සේවායෝජකයා අපොහොසත් වීම හැර වෙනත් හේතුවක් නිසා යම් ලිඛිත නීතියක් මගින් හෝ සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම අනුව, නියමිත දින ගණන සඳහා සේවය නොකරන සේවකයකු සම්බන්ධයෙන් වන විට, එම සේවකයාට ගෙවිය යුතු දීමනාව

2-P L 000623 -4,500 (2005/08)

ඒ මාසය සඳහා ඔහු සේවය කර ඇති දින සංඛ්‍යාවට අනුපාතිකව විය යුතු නමුත්, එම දීමනාව රුපියල් එක් දහසක් නොඉක්මවිය යුතු ය.

(ආ) දෛනික අනුප්‍රමාණයක් මත ගෙවනු ලබන සේවකයකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, මාසය තුළ ඔහු සේවය කර ඇති එක් එක් දිනය සඳහා දිනකට රුපියල් හතලිහ බැගින් ගණනය කරනු ලැබූ මුදලක් විය යුතු ය :

එසේ වුව ද, එක් මාසයක් සඳහා ගෙවිය යුතු සම්පූර්ණ දීමනාව රුපියල් එක් දහසක් නොඉක්මවිය යුතු ය ; සහ

(ඇ) කැලි ප්‍රමාණය අනුව ගෙවීම මත සේවයේ නියුක්තව සිටින සේවකයකු සම්බන්ධයෙන් වන විට යම් මාසයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු දීමනාව එම මාසය සඳහා එම සේවකයාට ගෙවිය යුතු වේතනයෙන් හෝ වැටුපෙන් සියයට දහයකට වඩා අඩු නොවිය යුතු ය :

එසේම තවදුරටත්, එක් මාසයක් සඳහා ගෙවිය යුතු සම්පූර්ණ දීමනාව රුපියල් එක් දහසක් නොඉක්මවිය යුතු ය.

(2) වේතනය හෝ වැටුප මසකට රුපියල් විසිදහසකට වැඩිව එහෙත් රුපියල් විසි එක් දහසකට නොවැඩිව ලබන සේවකයකුට, එක් එක් මාසය සම්බන්ධයෙන්, රුපියල් විසි එක් දහසක මුදල සහ ඒ මාසය වෙනුවෙන් වේතනය හෝ වැටුප ලෙස ඒ සේවකයා විසින් උපයාගන්නා ලද මුදල අතර වූ වෙනසට සමාන මුදලක් දීමනාවක් ලෙස ගෙවනු ලැබිය යුතු ය.

(3) 2004 ඔක්තෝම්බර් මාසය තුළ හෝ ඉන් පසුව වේතනය හෝ වැටුප් වර්ධකය ලබාගෙන ඇති සේවකයකු, රුපියල් දහසක මුදල සහ ඒ වේතනය හෝ වැටුප් වර්ධක මුදල අතර වූ වෙනසට සමාන මුදල සැලකිල්ලට ගනිමින් (1) වන උපවගන්තිය යටතේ ගෙවනු ලබන දීමනාවකට හිමිකම් ලැබිය යුතු ය.

(4) (අ) සාමූහික ගිවිසුමක් මගින් ; හෝ

(ආ) (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ නියමයකින් ඒ සේවකයා සම්බන්ධයෙන් සාමූහික ගිවිසුමක් අදාළ වීම දීර්ඝ කිරීමකින්,

ආවරණය වන්නා වූ සේවකයකු (1) වන උපවගන්තිය යටතේ වූ දීමනාවකට හිමිකම් නොලැබිය යුතු ය.

(5) කිසියම් කර්මාන්තයකට අදාළ ව පවතින ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරන ලද කිසියම් කර්මාන්තයකට අදාළ ව මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම එහි නිශ්චිත ව සඳහන් කර ඇති යම් දිනයකට කල් තබනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ උපවගන්තියට අනුකූලව කිසියම් කල් දැමීමක් ඒ නියමය කරනු ලබන දිනයේ සිට මාස හයකට වැඩි කාලයක් ඉක්මවා දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

සේවා නියුක්තිය අඛණ්ඩව පැවතීම සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

4. මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, 3 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, යම් සේවායෝජකයකු විසින් යම් කර්මාන්තයක සේවයේ නියුක්ත කරනු ලැබ ඇති සෑම සේවකයකු ම, නොකඩව එම සේවායෝජකයාගේ සේවකයකු වශයෙන් නොකඩව සේවය කරන තාක් කල්, අදාළ දිනයට පෙරාතුව වූ දිනයෙහි ඒ සේවකයා භුක්ති විඳිමින් සිටි කවර නාමයකින් හෝ පදවි නාමයකින් හෝ හඳුන්වනු ලබන මුදලින් කරන ලද වැටුප් දීමනා හෝ වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නොඅඩු වාසිසහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි මත එසේ නොකඩව සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය.

ලේඛනය පවත්වා ගෙනයාම සේවායෝජකයාගේ කාර්යය බව.

5. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට සහ එදිනට පසු ව, යම් කර්මාන්තයක සේවකයකුගේ සේවායෝජකයකු විසින්—

(අ) ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති එක් එක් සේවකයාගේ නම ;

(ආ) ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති එක් එක් සේවකයා විසින් ඉටුකරනු ලබන වැඩයේ වර්ගය ;

(ඇ) මේ පනතේ විධිවිධානවලට අනුකූල ව දීමනාවක් වශයෙන් එක් එක් සේවකයාට ගෙවනු ලබන මුදල,

දැක්වෙන ලේඛනයක්, ඒ කර්මාන්තය පවත්වාගෙන යනු ලබනතේ යම් ස්ථානයක ද ඒ ස්ථානයෙහි පවත්වාගෙන තබාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන සෑම ලේඛනයක් ම සේවායෝජකයා විසින් අවුරුදු හයක කාලයක් සඳහා සුරක්ෂිතව තබා ගත යුතු ය. පරීක්ෂා කිරීම සඳහා එම ලේඛනය ඉදිරිපත් කරන ලෙස හෝ එම ලේඛනයේ සත්‍ය පිටපතක් සපයන ලෙස හෝ එවැනි පිටපතක් සාදා ගැනීමට ඉඩ සලසන ලෙස කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ විට, එසේ කළ යුතු ය.

නිසි බලධරයාගේ බලතල.

**6**. නිසි බලධරයාට—

(අ) යම් ලේඛනයක් පරීක්ෂා කිරීමේ හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියාකරනු ලැබේ යයි නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා හෝ සේවකයන් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති යම් ස්ථානයකට දිවා හෝ රාත්‍රී කාලයේ සියලු යුක්ති සහගත වේලාවන් හි දී ඇතුළු වී එම ස්ථානය පරීක්ෂා කිරීමට ; හෝ

(ආ) තමා එම ස්ථානය පරීක්ෂා කරන විට, පරීක්ෂා කිරීම සඳහා එවැනි යම් ලේඛනයක් නොමැති නම්, ඒ ලේඛනය නියමිත පසු දිනයක දී පරීක්ෂා කිරීම සඳහා ඒ ස්ථානයේ දී හෝ එම බලධරයාගේ කාර්යාලයේ දී හෝ ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ; හෝ

(ඇ) එවැනි යම් සම්පූර්ණ ලේඛනයක හෝ එහි යම් කොටසක පිටපත් ගැනීමට ; හෝ

(ඈ) එම ස්ථානයේ දී තමාට දක්නට ලැබෙන්නා වූ ද, එම ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත සේවකයන්ගේ සේවායෝජකයකු බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ ද, යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට ; හෝ

(ඉ) යම් කර්මාන්තයක සේවයෙහි යෙදෙන සේවායෝජකයන්ගේ යම් සේවකයකුට—

(i) එවැනි යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සියලු ම සේවකයන්ට හෝ ඒ සේවකයන්ගෙන් සමන්විත වන යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අදාළ වන්නා වූ ද, මේ පනතේ කාර්ය සඳහා තමා විසින් නියම කරනු ලබන වෙනත් යම් විස්තර ඇතුළත් වන්නා වූ ද වාර වාර්තාවක් ;

(ii) එවැනි යම් සේවායෝජකයකු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක සඳහන් යම් විස්තර සම්බන්ධයෙන් තමා විසින් නියම කරන තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් ; හෝ

(iii) එවැනි යම් සේවායෝජකයකු විසින් පවත්වාගෙන යනු ලබන යම් සම්පූර්ණ ලේඛනයක හෝ එහි යම් කොටසක සත්‍ය පිටපතක්,

නිශ්චිත දිනයක දී හෝ ඉන් පෙර තමා වෙත සපයන ලෙස ලිඛිතව විධාන කිරීමට,

බලය තිබිය යුත්තේ ය.

වැරදි හෝ දණ්ඩන.

7. (අ) 6 වන වගන්තිය යටතේ යම් ඇතුළුවීමක් හෝ පරීක්ෂා කිරීමක් සඳහා හෝ නිසි බලධරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ නිසි බලධරයාට අවශ්‍ය වන උපකාර සැපයීම පැහැර හරින ; හෝ

(ආ) එම වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ බලධරයාට බාධා කරන හෝ හිරිහැර කරන ; හෝ

(ඇ) ඒ බලධරයා විසින් තමාට ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස නියම කරන ලද යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ප්‍රතික්ෂේප කරන ; හෝ

(ඈ) යම් ලේඛනයක යම් තොරතුරක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නා වූ, යම් ප්‍රකාශයක් කරන හෝ කරනු ලැබීමට සලස්වන නැතහොත් එම බලධරයා වෙත යම් ලේඛනයක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබීමට සලස්වන නැතහොත් දැන දැනම ඉදිරිපත් කරනු ලැබීමට ඉඩ හරින ; හෝ

(ඉ) ඒ වගන්තියෙන් පවරනු ලැබූ බලතල යටතේ ක්‍රියාකරන එම බලධරයාට යම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම සපයන ; හෝ

(ඊ) 6 වන වගන්තිය යටතේ එම බලධරයා විසින් දෙන ලද යම් විධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ඒ වගන්තිය

යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට යම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර වාර්තාවක් දැන දැනම ඉදිරිපත් කරන හෝ සපයන හෝ ඉදිරිපත් කිරීමට හෝ සැපයීමට සලස්වනු ලබන,

යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

මේ පනත යටතේ ලැබිය යුතු ගෙවීම් සේවකයකුගේ වේතන හෝ වැටුප්වල කොටසක් විය යුතු බව.

**8**. මේ පනත යටතේ සේවකයකුට ගෙවිය යුතු දීමනාව, සියලු කාර්ය සඳහා—

(අ) සේවක අර්ථ සාධක අරමුදලට, සේවක භාරකාර අරමුදලට සහ විශ්‍රාම වැටුපට ගෙවන ලද දායක මුදල් ;

(ආ) වාර්ෂික නිවාඩු පාරිශ්‍රමික ;

(ඇ) අතිකාල දීමනා පාරිශ්‍රමික ;

(ඈ) ප්‍රසූත ප්‍රතිලාභ ගෙවීම් ; සහ

(ඉ) පාරිතෝෂික මුදල්,

ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු අතර, එම සේවකයාගේ වේතනවල හෝ වැටුපෙහි කොටසක් විය යුතු ය. යම් සේවකයකුගේ සෑම සේවායෝජකයකු ම යම් ලිඛිත නීතියකින් එවැනි සේවකයකුගේ වේතනය හෝ වැටුප ගෙවීමට නියම කරනු ලැබූ යම් කාලසීමාව තුළ එම දීමනාව ඒ සේවකයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

සේවකයන්ට ලැබිය යුතු මුදල් ගෙවීම් පැහැරහැරීම.

**9**. (1) මේ පනතේ සේවකයකුට ගෙවීමට නියම කරනු ලැබ ඇති යම් මුදලක් ගෙවීම පැහැර හරින යම් සේවායෝජකයකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ සේවකයකුට ගෙවීමට නියම කර ඇති යම් මුදලක් ගෙවීම පැහැර හරින යම් සේවායෝජකයකු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයා එම වරද සඳහා අධිකරණය විසින් නියම කළ හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව ආඥාවේ සඳහන් කාලයක් ඇතුළත, ඒ මුදල ඒ සේවකයාට ගෙවන ලෙස එම සේවායෝජකයාට ආඥා කරනු ලැබිය හැකි ය. තව ද, ඒ මුදල එසේ නොගෙවනු ලැබුවහොත්, ඒ මුදල අධිකරණය විසින් නියම කරන ලද දඩයක් මෙන් අධිකරණයේ ආඥාව පිට අයකරනු ලැබ ඒ සේවකයාට ගෙවනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල සේවකයන්ට ලැබිය යුතු මුදල් අයකර ගැනීම.

**10**. (1) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගේ සේවකයකුට ගෙවීමට නියමිත යම් මුදලක් ගෙවීම පැහැර හැරීම වෙනුවෙන් යම් සේවායෝජකයකු වරදකරුවකු කරනු ලැබ ඇති අවස්ථාවක, සේවායෝජකයා එසේ වරදකරු කරනු ලැබූ වරද පිළිබඳව අධිකරණය වෙත පැමිණිල්ල කළ දිනයට පෙරාතුව ම වූ අවුරුදු හයක් ඇතුළත, යම් අවස්ථාවක දී ඒ සේවකයාට හෝ වෙනත් යම් සේවකයකුට හෝ සේවකයන්ට මේ පනතේ විධිවිධානවලට අනුව ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන්, ඒ සේවායෝජකයා විසින් කරන ලද යම් පැහැරහැරීමක් පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන බවට නඩු විභාගය ආරම්භවීමට පෙර යම් අවස්ථාවක දී ඒ සේවායෝජකයා වෙත නියමිත ආකෘතියෙහි වූ දැන්වීමක් කර ඇත්නම්, එසේ සාක්ෂි දීම කළ හැකි අතර, ඒ පැහැරහැරීම ඔප්පු වූ විට සේවායෝජකයාගෙන් ඒ සේවකයාට හෝ සේවකයන්ට ලැබිය යුතු යයි අධිකරණයට පෙනී යන යම් මුදලක් ගෙවන ලෙස අධිකරණය විසින් ඒ සේවායෝජකයාට නියම කළ හැකි ය. මේ උපවගන්තිය යටතේ ගෙවන ලෙස නියම කරනු ලැබූ යම් මුදලක්, අධිකරණය විසින් පනවන ලද දඩයක් අයකර ගන්නා ආකාරයෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියෙහි "නියමිත" යන්නෙන්, 11 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ.

නියෝග.

**11**. (1) මේ පනත යටතේ නියෝග සෑදීමට බලය පවරා ඇති හෝ නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ එම නියෝගයෙහි සඳහන් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද්දක් ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් සිදු නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**12**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"සාමූහික ගිවිසුම" යන්නට, (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"කොමසාරිස්වරයා" යන්නෙන්, තත්කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර, තත්කාලයෙහි නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ලෙස, සහකාර කම්කරු කොමසාරිස් ලෙස හෝ කම්කරු නිලධරයකු ලෙස ධුරය දරන තැනැත්තකු ද ඊට ඇතුළත් වේ ;

"සේවායෝජකයා" යන්නෙන්, තමා වෙනුවෙන් ම හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කර්මාන්තයක යම් සේවකයකු සේවයේ නියුක්ත කරන යම් තැනැත්තකු අදහස් වන අතර, ඊට වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කර්මාන්තයක යම් සේවකයකු සේවයේ නියුක්ත කරනු ලබන යම් තැනැත්තකු ද ඇතුළත් වේ ;

"කර්මාන්තය" යන්නට, සේවායෝජකයකු විසින්, සේවකයකු විසින් හෝ පවත්වාගෙන යනු ලබන, කරනු ලබන හෝ කරගෙන යනු ලබන, යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළඳ ව්‍යාපාරයක්, රජයට අයත් වෙළඳ ව්‍යාපාරයක්, රැකියාවක්, වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් අංශයක් හෝ එබන්දක යම් කටයුත්තක් හෝ ක්‍රියාවලියක් ඇතුළත් වන නමුත්, සේවායෝජකයකුගේ තත්ත්වයෙන් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම ප්‍රාග්ධනය සපයනු ලැබූ යම් සංස්ථාගත හෝ සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් විසින් පවත්වා ගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක් ඊට ඇතුළත් නොවේ ;

"වේතන" හෝ "වැටුප්" යන්නෙන් —

(අ) සේවකයාගේ ගිවිසගත් වේතනය හෝ වැටුප නැතහොත් සේවකයා අයත්වන කර්මාන්තය සඳහා අදාළ පඩි පාලක සභාව විසින් නියමිත වේතනය ; සහ

(ආ) 1968 අංක 40 දරන සේවා නියුක්තයන්ගේ අතුරු අවප්‍රමාණ කිරීමේ දීමනා පනත යටතේ සේවකයන්ට ගෙවනු ලබන යම් මුදලක්,

ඇතුළුව යම් ඉපයීමක් අදහස් වේ ;

"සේවකයා" යන්නෙන්, යම් කර්මාන්තයක යම් සේවයක් ඉටු කිරීම, සඳහා ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන වූ ගිවිසුමක් යටතේ යම් සේවායෝජකයකු විසින් යම් තනතුරක සේවයේ නියුක්ත කරන ලද සේවා නියුක්තයකු, දෛනික වේතනයක් උපයන සේවා නියුක්තයකු අදහස් වන අතර, එයට යම් ලිඛිත නීතියකින් හෝ අන්‍යාකාරයකින් වැටුප් හෝ වේතන විධිමත් කරනු ලැබූ සේවකයකු සහ කෑලි ප්‍රමාණය අනුව ගෙවීමට සේවයේ නියුක්ත කර ඇති සේවකයකු ඇතුළත් වන නමුත් ගෘහ සේවකයකු හෝ සේවායෝජකයකුගේ පෞද්ගලික රියදුරකු ඊට ඇතුළත් නොවේ.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.